# (ඇ) කාර්මික නිෂ්පාදනය

## 1. හැඳින්වීම

කර්මාන්ත අංශයේ නිෂ්පාදනය හා සේවා නියුක්තිය පිළිබඳ දත්තයන් 1974 වර්ෂය සඳහා ද ලබා ගන්නා ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි කාර්මික නිෂ්පාදන ආයතනයන් අමතා යවන ලද ප්‍රශ්නමාලාවන් මගිනි. කාර්මික ආයතන හැකිතෙක් වැඩි සංඛ්‍යාවක් මීට අඩංගු කිරීම සඳහා පරිශ්‍රම දරන ලදී. (මහ බැංකුව වෙත සපයනු ලබන තොරතුරු අතිශයින් රහසිගත සේ සලකනු ලබන අතර, කිසියම් ආයතනයක් අරබයා වූ දත්තයන් තනි වශයෙන් ගෙන හෙළි නොකරනු ලබන බවට පොරොන්දුවක් ප්‍රශ්න මාලාවෙහි අන්තර්ගත විය )

නිකුත් කරනු ලැබූ මුළු ප්‍රශ්නමාලා සංඛ්‍යාව 3513 කි. මින් තොරතුරු පිරවූ ප්‍රශ්න මාලා 1827 ක් පමණක් ආපසු ලැබුණි. මෙය සියයට 51 ක ප්‍රතිචාර අනුපාතයකි. ලේඛන 229 ක් පමණ තැපැලෙන් නොබෙදු ආපසු හැරී ආ අතර, තවත් 217 ක් එකී කර්මාන්තවල නිෂ්පාද-නයන් නොකැරුන බව සඳහන් කරමින් ආපසු එවනු ලැබුණේ විය.

සාමාන්‍යයෙන් ගත් කළ, 1974 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදනය දක්වා ඇති ප්‍රගතිය ඉතා අල්පය. විදේශ විනිමය හිඟය, ප්‍රාග්ධන හිඟය හා වෙළෙඳ පොළේ බලවේග නිදහස් ලෙස ක්‍රියාත්මක වීමට ඇති සීමාවන් කාර්මික ප්‍රගතියට දිගින් දිගට ම බාධාවක්ව පවතී. මූර්ත වශයෙන් ගත් කල, කාර්මික නිෂ්පාදනය වර්ධනය වී ඇත්තේ ආන්තික වශයෙන් පමණක් වන අතර, එයටද හේතු වී ඇත්තේ 1974 දී සමීක්ෂණය වඩා පුළුල්වීමය. 1973 හා 1974 යන දෑවුරුද්දේ දී ම වාර්තා කරනු ලැබූ ව්‍යවසායයන් ගත් කල ඒවායේ නිෂ්පාදනයේ මූර්ත වටිනාකමේ අඩු වීමක් 1974 දී පෙන්වා ඇත. කාර්මික අංශයේ අපනයන පරිමාණය තවමත් ඉතා පහත් මට්ටමක පවතින අතර, කාර්මික නිෂ්පාදනයෙහි අන්තර්ගත ආනයන ද්‍රව්‍ය ප්‍රමාණය ඉතා අධිකව පවතී. ආනයන මත දැඩි සේ රඳ පවතින කුඩා ආර්ථික-යකට, තම දේශීය කර්මාන්තයන් අපනයනය කෙරෙහි නැඹුරුවීම අත්‍යාවශ්‍යය. එහෙත්, දේශීය කර්මාන්තයනට සලසා දී ඇති දැඩි ආරක්ෂාව හා ආනයන භාණ්ඩ වෙතින් තරඟයක් එල්ල නොවීම යන කරුණු මෙකී දේශීය කර්මාන්තයන් අපනයන වෙළෙඳ පොළ වෙත නැඹුරු කිරීමට අවශ්‍ය වන ගුණය හා කාර්යක්ෂමතා පිළිබඳ උසස් මට්ටමට පැමිණීමට බාධා වී ඇත. නිෂ්පාදන භාණ්ඩ දුර්ලභතාවයන්ගෙන් පිරී පවතින දේශීය වෙළෙඳ පොල, දේශීය කර්මාන්තයන්හි නිෂ්පාදන භාණ්ඩවලට වඩාත් ලාභදායක වෙළෙඳ පොල බවට පත් වී ඇත. එ නිසා විදේශීය වෙළෙඳ පොල දේශීය කර්මාන්තවලට වඩාත් රුචි කරවීමට අවශ්‍ය තත්වයන් සැලසීම දීර්ඝකාලීන ක්‍රමෝපායක් වශයෙන් ශ්‍රී ලංකාව විසින් කළයුතුම ය.

## 2. නිෂ්පාදනය

II (ඇ) 1 වැනි සංඛ්‍යා සටහන මගින් 1971 – 74 කාලය තුළ සේවා නියුක්තිය හා වර්තන මිළ අනුව නිෂ්පාදනයේ වටිනාකම පිළිබඳ සංඛ්‍යාමය සාරාංශයන් පෙන්වනු ලබන අතර, II (ඇ) 2 සංඛ්‍යා සටහන අනුව 1970–74 කාල සීමාව තුළ කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කාර්මික ගණයන් සහ ප්‍රධාන නිෂ්පාදන අනුව ද, II (ඇ) 2 (1) සංඛ්‍යා සටහන එකී කාලය තුල කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ස්ථාවර මිළ අනුව ද පෙන්වනු ලැබේ.

## 1971 - 1974 කාර්මික නිෂ්පාදනය හා

| කාර්මික ගණය | සමාගම් ගණන | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 |
| I. ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් .. .. | 527 | 304* | 251* | 155* | 33866 | 32776 | 23879 | 15912 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. .. | 634 | 639 | 535 | 639 | 22568 | 29083 | 29994 | 30391 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. .. | 15 | 11 | 8 | 18 | 4127 | 4668 | 4058 | 5366 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. .. | 74 | 67 | 63 | 64 | 4645 | 4323 | 5105 | 4935 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 244 | 196 | 169 | 207 | 16888 | 15769 | 12113 | 12630 |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 51 | 64 | 71 | 68 | 9929 | 8595 | 8532 | 9363 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. .. | 1 | 1 | 1 | 1 | 952 | 1011 | 1167 | 1270 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ [යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. .. | 287 | 280 | 274 | 317 | 15089 | 21483 | 18663 | 15872 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 64 | 64 | 47 | 28 | 2127 | 2453 | 2204 | 929 |
| එකතුව .. | 1897 | 1626* | 1419* | 1497* | 110191 | 123986 | 105715 | 96668 |

* 1972 න් පසු පිළිතුරු සැපයූ ආයතන සංඛ්‍යාවේ පහත වැටීමට විශාල වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා දුම්කොළ කර්මාන්ත

II (ඇ) 1 සංඛ්‍යා සටහන

## සේවා නියුක්ති සංඛ්‍යාමය විස්තර සම්පිණ්ඩනය

| ශ්‍රමික දින එකතුව (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපි. දශ ලක්‍ෂ) | | | | නිෂ්පාදන වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | | ඒක ශ්‍රම දිනක වැටුප් (රුපියල්) | | | | සේවකයෙකුට වෙන්වන ශ්‍රම දින | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 | 1971 | 1972 | 1973 | 1974 |
| 7747 | 7856 | 4749 | 4623 | 70·5 | 82·7 | 59·2 | 86·4 | 743·0 | 798·7 | 919·6 | 1247·3 | 9·10 | 10·52 | 12·46 | 18·69 | 229 | 239 | 199 | 291 |
| 5254 | 8536 | 7090 | 5273 | 43·3 | 72·9 | 61·4 | 75·8 | 306·2 | 394·5 | 420·8 | 570·8 | 8·24 | 8·54 | 8·67 | 14·38 | 233 | 259 | 236 | 173 |
| 798 | 1099 | 1164 | 1155 | 8·8 | 13·3 | 15·4 | 16·7 | 26·6 | 30·7 | 43·0 | 53·1 | 11·03 | 12·09 | 13·25 | 14·46 | 193 | 235 | 287 | 215 |
| 1228 | 1262 | 1303 | 888 | 11·9 | 14·6 | 17·3 | 18·8 | 70·3 | 79·1 | 101·0 | 136·5 | 9·69 | 11·52 | 13·24 | 21·17 | 264 | 291 | 255 | 180 |
| 4358 | 4504 | 2931 | 4229 | 72·3 | 82·7 | 57·1 | 74·3 | 530·0 | 563·8 | 650·7 | 1353·0 | 16·58 | 18·36 | 19·64 | 17·57 | 258 | 285 | 242 | 192 |
| 2193 | 2345 | 2175 | 1595 | 25·8 | 37·4 | 37·6 | 39·9 | 176·4 | 172·9 | 190·0 | 238·2 | 11·76 | 15·96 | 17·31 | 25·02 | 221 | 276 | 255 | 170 |
| 220 | 304 | 350 | 280 | 4·7 | 3·9 | 7·6 | 9·7 | 58·6 | 67·5 | 53·2 | 129·6 | 21·36 | 12·66 | 21·59 | 34·64 | 231 | 300 | 300 | 221 |
| 3960 | 5033 | 4621 | 3408 | 39·8 | 54·9 | 59·7 | 56·2 | 273·5 | 304·8 | 347·1 | 349·2 | 10·05 | 10·90 | 12·93 | 16·49 | 262 | 234 | 248 | 215 |
| 474 | 671 | 579 | 158 | 2·9 | 5·5 | 6·0 | 1·9 | 23·1 | 30·4 | 33·2 | 16·2 | 6·12 | 8·20 | 10·38 | 12·03 | 223 | 273 | 263 | 171 |
| 26232 | 31610 | 24962 | 21609 | 280·0 | 367·9 | 321·8 | 379·7 | 2207·7 | 2442·4 | 2758·6 | 4093·9 | 10·67 | 11·63 | 12·89 | 19·17 | 238 | 255 | 238 | 205 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංස්ථාව මගින් සුළු බීඩි නිෂ්පාදන ඒකකයන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධයෙන් ඒකාබද්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීමයි.

## 1970/74 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම කර්මාන්තවල

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශ ලක්ෂ) 1970 | 1971 | 1972 | 1973 | 1974 |
|---|---|---|---|---|---|
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 684·5 | 743·0 | 798·7 | 919·6 | 1247·3 |
| (අ) සැකසූ ආහාර .. .. .. | 250·6 | 263·2 | 322·9 | 382·2 | 472·3 |
| (ආ) එළවළු තෙල් වර්ග සහ මේද .. .. | 170·1 | 190·4 | 143·9 | 157·7 | 357·9 |
| (ඇ) කල්තබාගත හැකි සහ ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස් මාළු සහ අනෙකුත් මුහුදු ආහාර .. | 11·8 | 23·2 | 11·5 | 12·5 | 48·1 |
| (ඇ) විස්කෝතු, කොකෝවා, චොකලට් සහ සීනි රසකැවිලි | 50·5 | 53·1 | 50·2 | 44·3 | 47·2 |
| (ඉ) පාන වර්ග සහ ස්ප්‍රිතු .. .. .. | 94·9 | 88·1 | 96·5 | 94·8 | 116·7 |
| (ඊ) දුම්කොළ .. .. .. | 106·6 | 124·9 | 173·7 | 228·1 | 205·1 |
| II. රෙදිපිලි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 282·7 | 306·2 | 394·5 | 420·8 | 570 8 |
| (අ) ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් හා අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 64·3 | 70·8 | 66·7 | 64·1 | 100·0 |
| (ආ) නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | 173·3 | 189·4 | 271·2 | 295·6 | 399·4 |
| (ඇ) පාවහන් සහ සම් නිෂ්පාදිතයන් .. .. | 45·1 | 46·0 | 56·6 | 60·1 | 71·4 |
| III. දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 21·2 | 26·6 | 30·7 | 43·0 | 53·1 |
| (අ) දැව නිෂ්පාදිත .. .. .. | 10·4 | 12·8 | 12·7 | 11·6 | 3·7 |
| (ආ) තුනී ලෑලි .. .. .. | 10·8 | 13·8 | 18·0 | 31·4 | 49·4 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. .. | 65·0 | 70·3 | 79·1 | 101·0 | 136·5 |
| V. රසායනික, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයන් .. .. .. | 439·2 | 530·0 | 563·8 | 650·7 | 1353·0 |
| (අ) කාර්මික රසායන ද්‍රව්‍ය .. .. .. | 3·1 | 3·3 | 5·2 | 5·6 | 6·2 |
| (ආ) විවිධ රසායනික නිෂ්පාදිතයන් .. .. | 155·9 | 230·3 | 213·5 | 161·4 | 242·9 |
| (ඇ) පෙට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිතයන් .. | 191·0 | 198·5 | 259·5 | 395·8 | 954·9 |
| (ඇ) රබර් නිෂ්පාදිතයන් .. .. .. | 56·4 | 60·2 | 67·7 | 67·8 | 129·0 |
| (ඉ) ප්ලාස්ටික් නිෂ්පාදිතයන් .. .. .. | 32·8 | 37·7 | 17·9 | 20·1 | 20·0 |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනය (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | 138·8 | 176·4 | 172·9 | 190·0 | 238·1 |
| (අ) පිඟන් බඩු .. .. .. | 8·0 | 8·5 | 12·9 | 13·1 | 44·6 |
| (ආ) වීදුරු සහ වීදුරු නිෂ්පාදිතයන් .. .. | 8·1 | 13·9 | 11·9 | 12·8 | 12·7 |
| (ඇ) සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් .. .. | 104·8 | 116·7 | 110·4 | 131·4 | 160·8 |
| (ඇ) ඉල්මනයිට් නිෂ්පාදනය .. .. .. | 4·7 | 6·2 | 3·7 | 4·8 | 2·3 |
| (ඉ) ගඩොල් සහ උළු .. .. .. | 13·2 | 13·1 | 34·0 | 27·9 | 17·7 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. .. .. | 38·9 | 58 6 | 67·5 | 53·2 | 129·6 |
| (අ) යකඩ සහ වානේ මූලික කර්මාන්ත .. . | 38·9 | 58·6 | 67·5 | 53·2 | 129·6 |
| VIII. සකස් කල ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ නිෂ්පාදනයන් .. .. .. | 256·1 | 273·5 | 304·8 | 347·1 | 349·2 |
| (අ) සකස් කරන ලද ලෝහ භාණ්ඩ (යන්ත්‍රෝපකරණ හැර) .. | 96·9 | 128·0 | 111·1 | 135·6 | 119·3 |
| (ආ) යන්ත්‍ර සූත්‍ර (විදුලි නොවන යන්ත්‍රසූත්‍ර) සහ ප්‍රවාහන උපකරණ | 70·8 | 57·3 | 98·9 | 102·5 | 93·4 |
| (ඇ) විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම් උපකරණ හා සැපයුම් .. | 88·4 | 88·2 | 94·8 | 109·0 | 136·5 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 18·6 | 23·1 | 30·4 | 33·2 | 16·2 |
| එකතුව .. .. .. | 1,945.0 | 2,207.7 | 2,442.4 | 2758·6 | 4,093·9 |

II (ඈ) 2 සංඛ්‍යා සටහන

## ස්වරූපය හා ප්‍රධාන නිෂ්පාදන අනුව

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
| 100·0 | 100 0 | 100·0 | 100·0 | 100·0 | 35·2 | 33·7 | 32·7 | 33·4 | 30·5 |
| 36·6 | 35·4 | 40·5 | 41·6 | 37·9 | 12·0 | 11·9 | 13·2 | 13·9 | 11·5 |
| 24·9 | 25·6 | 18·0 | 17·1 | 28·7 | 8·7 | 8·6 | 5·9 | 5·7 | 8·7 |
| 1·7 | 3·1 | 1·4 | 1·4 | 3·8 | 0·6 | 1·1 | 0·5 | 0·5 | 1·2 |
| 7·4 | 7·2 | 6·3 | 4·8 | 3·8 | 2·6 | 2·4 | 2·0 | 1·6 | 1·2 |
| 13·9 | 11·9 | 12·1 | 10·3 | 9·4 | 4·9 | 4·0 | 4·0 | 3·4 | 2·9 |
| 15·6 | 16·8 | 21·7 | 24·8 | 16·4 | 5·5 | 5·7 | 7·1 | 8·3 | 5·0 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 14·5 | 13·9 | 16·1 | 15·2 | 13·9 |
| 22·7 | 23·1 | 16·9 | 15·2 | 17·5 | 3·3 | 3·2 | 2·7 | 2·3 | 2·4 |
| 61·3 | 61·9 | 68·8 | 70·5 | 70·0 | 8·9 | 8·6 | 11·1 | 10·7 | 9·8 |
| 16·0 | 15·0 | 14·3 | 14·3 | 12·5 | 2·3 | 2·1 | 2·3 | 2·2 | 1·7 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 1·1 | 1·2 | 1·3 | 1·5 | 1·3 |
| 49·1 | 48·1 | 41·4 | 27·0 | 7·0 | 0·5 | 0·6 | 0·5 | 0·4 | 0·1 |
| 50·9 | 51·9 | 58·6 | 73·0 | 93·0 | 0·6 | 0·6 | 0·8 | 1·1 | 1·2 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 3·3 | 3·2 | 3·2 | 3·7 | 3·3 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 22 6 | 24·0 | 23·1 | 23·6 | 33·1 |
| 0·7 | 0·6 | 0·9 | 0·9 | 0·5 | 0·2 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| 35·5 | 43·5 | 37·9 | 24·8 | 18·0 | 8·0 | 10·4 | 8·8 | 5·9 | 5·9 |
| 43·5 | 37·4 | 46·0 | 60·8 | 70·5 | 9·8 | 9·0 | 10·6 | 14·4 | 23·3 |
| 12·8 | 11·4 | 12·0 | 10·4 | 9·5 | 2·9 | 2·7 | 2·8 | 2·5 | 3·2 |
| 7·5 | 7·1 | 3·2 | 3·1 | 1·5 | 1·7 | 1·7 | 0·7 | 0·6 | 0·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 7·1 | 8·0 | 7·1 | 6·9 | 5·8 |
| 5·8 | 4·8 | 7·5 | 6·9 | 18·7 | 0·4 | 0·4 | 0·5 | 0·5 | 1·1 |
| 5·8 | 7·9 | 6·9 | 6·7 | 5·3 | 0·4 | 0·6 | 0·5 | 0·4 | 0·3 |
| 75·5 | 66·2 | 63·8 | 69·2 | 67·5 | 5·4 | 5·3 | 4·5 | 4·8 | 3·9 |
| 3·4 | 3·5 | 2·1 | 2·5 | 1·0 | 0·2 | 0·3 | 0·2 | 0·2 | 0·1 |
| 9·5 | 17·6 | 19·7 | 14·7 | 7·5 | 0·7 | 1·4 | 1·4 | 1·0 | 0·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 2·0 | 2·6 | 2·8 | 1·9 | 3·2 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 2·0 | 2·6 | 2·8 | 1·9 | 3·2 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 13·2 | 12·4 | 12·5 | 12·6 | 8·5 |
| 37·8 | 46·8 | 36·5 | 39·1 | 34·2 | 5·0 | 5·8 | 4·5 | 4·9 | 2·9 |
| 27·6 | 21·0 | 32·4 | 29·5 | 26·7 | 3·6 | 2·6 | 4·1 | 3·7 | 2·3 |
| 34·5 | 32·2 | 31·1 | 31·4 | 39·1 | 4·5 | 4·0 | 3·9 | 4·0 | 3·3 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 1·0 | 1·0 | 1·2 | 1·2 | 0·4 |
| | | | | | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඇ) 2 (1) සංඛ්‍යා සටහන
## ස්ථාවර මිල අනුව කාර්මික නිෂ්පාදනයෙහි වටිනාකම 1970–74

| කාර්මික ගණය | නිෂ්පාදන වටිනාකම (රුපියල් දශලක්ෂ) | | | | | වාර්ෂික ප්‍රතිශත වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 684·5 | 735·6 | 789·4 | 870·4 | 902·8 | — | + 7·5 | + 7·3 | +10·3 | + 3·7 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | 282·7 | 327·1 | 373·7 | 315·2 | 197·4 | — | +15·7 | +14·3 | −15·7 | −37·4 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 21·2 | 26·7 | 31·5 | 41·4 | 43·5 | — | +25·9 | +18·0 | +31·4 | + 5·1 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 65·0 | 83·6 | 81·2 | 75·3 | 75·5 | — | +28·6 | − 2·9 | − 7·3 | + 0·3 |
| V. රසායනද්‍රව්‍ය, ඛනිජතෙල්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 439·2 | 666·8 | 534·9 | 474·3 | 585·4 | — | +51·8 | −19·8 | −11·3 | +23·4 |
| VI. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 138·8 | 101·4 | 119·7 | 96·5 | 122·3 | — | −27·0 | +18·1 | −19·4 | +26·7 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. | 38·9 | 57·9 | 61·6 | 42·2 | 70·1 | — | +48·8 | + 6·4 | −31·5 | +66·1 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහණ උපකරණ නිෂ්පාදනය .. | 256·1 | 241·5 | 221·3 | 201·8 | 174·5 | — | − 5·7 | − 8·4 | − 8·8 | −13·5 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අ. ස. නො.) .. | 18·6 | 17·4 | 15·4 | 11·3 | 4·5 | — | − 6·5 | −11·5 | −26·6 | −60·2 |
| එකතුව | 1,945·0 | 2,258·0 | 2,228·7 | 2,128·4 | 2,176·0 | — | +16·1 | − 1·3 | − 4·5 | + 2·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වර්තන මිළ අනුව ගත වූ වර්ෂයේ දී රුපියල් ලක්ෂ 27586 ක් හා සැසැඳූ කල 1974 දී නිෂ්පාදනයේ වටිනාකම රුපියල් ලක්ෂ 40939 ක් විය. වාර්තා කළ ව්‍යවසායයන්ගේ සංඛ්‍යාව ද 1973 දී 1419 සිට 1974 දී 1497 තෙක් වැඩි විය. වාර්තා කරනු ලබන ව්‍යවසාය-යන්ගේ මුළු සංඛ්‍යාවෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් අයත් වන්නේ මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමෙන් සියයට 15 ක් පමණකට හිමිකම් කියන රෙදිපිළි සහ සම් කර්මාන්ත ගණයටය.

වර්තන මිළ අනුව 1974 දී නිෂ්පාදන වටිනාකමෙහි වූ සැලකිය යුතු වැඩිවීම ප්‍රධාන වශයෙන් ම වර්ෂය තුල අත්දුටු උද්ධමන නැමියාවන්ගේ පිළිබිඹුවකි. නිෂ්පාදන වටිනාකමෙහි වූ වර්ධනයෙන් වැඩි කොටසක් 1974 දී ඇති වූ තෙල් මිළ ඉහළ යෑමේ හේතුවෙන් ඛණිජ නිෂ්පාදනවල වටිනාකමේ ඇති වූ මෙතෙක් නොවූ විරූ අන්දමේ වැඩිවීම නිසාය. 1974 දී ඛණිජ නිෂ්පාදන පරිමාව සියයට 15 කින් පහත වැටුණ ද, 1973 දී රුපියල් ලක්ෂ 3790 සිට 1974 දී රුපියල් ලක්ෂ 9490 තෙක් සියයට 151 කින් ඛනිජ නිෂ්පාදන වල වටිනාකම වැඩි වී ඇත. මූර්ත වශයෙන් 1974 දී කාර්මික නිෂ්පාදනයේ වටිනාකම සියයට 2·2 කින් වැඩි විය. එසේ වුවද, වාර්තා කළ ව්‍යවසායයන්ගේ වැඩිවීම සඳහා නිරවද්‍ය කළ විට කාර්මික නිෂ්පාදනයේ මූර්ත වටිනාකම සියයට 5·2 කින් අඩු වී ඇති බව ඇස්තමේන්තු කැරේ.

II (ඇ) 2 (2) සංඛ්‍යා සටහන අනුව 1973 හා 1974 යන වර්ෂ දෙකේ දීම පිළිතුරු සැපයූ කාර්මික ආයතනයන්ගේ කාර්මික නිෂ්පාදන වටිනාකම වර්තන මිළ හා ස්ථාවර මිළ අනුව දක්වේ. මෙහි දී ද 1974 දී නිෂ්පාදනයෙහි වර්තන වටිනාකම සියයට 39·4 කින් වැඩි වූ බව පෙන්වන අතර, මූර්ත වශයෙන් එහි පහත වැටීමක් පෙන්නුම් කෙරේ.

## II (ඇ) 2 (2) සංඛ්‍යා සටහන

## 1973/74 වර්ෂයන් දෙක සඳහා පිළිතුරු සැපයූ ඒකකයන්ගේ නිෂ්පාදන වටිනාකම

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | වර්තන මිළ | | | වෙනස සියයට ගණනක් වශයෙන් | ස්ථාවර (1970) මිළ | | වෙනස සියයට ගණනක් වශයෙන් |
|---|---|---|---|---|---|---|---|
| | ආයතන සංඛ්‍යාව | 1973 | 1974 | | 1973 | 1974 | |
| I. ආහාර පාන වර්ග සහ දුම්කොල නිෂ්පාදනය .. | 89 | 604·9 | 899·3 | + 48·7 | 572·5 | 651·0 | + 13·7 |
| II. රෙදිපිලි ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 312 | 375·3 | 413·4 | + 10·2 | 281·1 | 142·9 | − 49·2 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළු) .. | 3 | 3·1 | 2·1 | − 32·3 | 3·0 | 1·7 | − 43·3 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 29 | 71·1 | 110·5 | + 55·4 | 52·9 | 61·1 | + 15·5 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. .. | 99 | 142·7 | 217·4 | + 52·4 | 99·2 | 88·5 | − 10·8 |
| VI. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. .. | 27 | 62·4 | 86·8 | + 39 1 | 31·7 | 44·6 | + 40·7 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. .. | 1 | 53·2 | 129·6 | +143·6 | 42·3 | 70·1 | + 65·7 |
| VIII. සකස් කල ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. .. | 146 | 183 0 | 224 3 | + 22·6 | 106·4 | 112·0 | + 5·3 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක නොසඳහන්) .. | 9 | 1·3 | 2·8 | +115·4 | 0·4 | 0·8 | +100·0 |
| එකතුව .. .. | 715 | 1497·0 | 2,086·2 | + 39·4 | 1,189·5 | 1,172·7 | − 1·4 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**3· ධාරිතාව උපයෝගී කිරීම :**

උපයෝගී කර ගනු ලැබූ ධාරිතාව කර්මාන්ත අංශයේ මුළු ධාරිතාවෙහි ප්‍රතිශතයක් වශයෙන් II (ඇ) 2 (3) සංඛ්‍යා සටහනින් දක්වේ. 1974 දී කර්මාන්ත අංශයේ මුළු ධාරිතාවෙන් සියයට 60 ක් පමණ උපයෝගී කොට ගෙන නොතිබුනි. අධික ලෙස ධාරිතාව උපයෝගී කොට නොගැනීමට අමු ද්‍රව්‍ය දුර්ලභතාවය එක් හේතුවක් වන්නට ඇති අතර, අධික නිෂ්පාදන වියදම අනෙක් හේතුව විය හැකිය. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත (ගල් අඟුරු හා ඛණිජ තෙල් හැර) හා ආහාරපාන හා දුම්කොළ යන කර්මාන්ත ගණයන්හි ධාරිතා උපයෝගී කිරීම තරමක් ඉහළ තත්ත්වයක විය. රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදන අංශයන්හි ධාරිතාව උපයෝගී කොට ඇත්තේ ඉතා මඳ වශයෙනි. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහණ උපකරණ නිෂ්පාදන හා දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදන අංශවල ධාරිතාව උපයෝගී කරනු ලැබ ඇත්තේ, සාපේක්ෂව බලන කල, මඳ වශයෙනි.

**II (ඇ) 2 (3) සංඛ්‍යා සටහන**

**ධාරිතා උපයෝගී කිරීම - 1974**

| කාර්මික ගණය | | සමාගම ගණන | නිම,වුම ධාරිතාව (ඒකක දහස් ගණනින්) | නිමැවුම ප්‍රමාණයේ (ඒකක දහස් ගණනින්) | ධාරිතා උපයෝගී කර ගැනීම |
|---|---|---|---|---|---|
| I. | ආහාර පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 91 | 250,589 | 163,247 | 65·1 |
| II. | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 410 | 194,130 | 88,500 | 45·6 |
| III. | දැව සහ දැව භාණ්ඩ නිෂ්පාදනය (ගෘහ භාණ්ඩ ඇතුළුව) | 10 | 162,906 | 52,937 | 32·5 |
| IV. | කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 39 | 106,233 | 48,781 | 45·9 |
| V. | රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 136 | 211,982 | 18,823 | 8·9 |
| VII. | ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 42 | 65,987 | 51,480 | 78·0 |
| VII. | මූලික ලෝහ නිෂ්පාදනයන් .. | 1 | 83,800 | 37,151 | 44·3 |
| VIII. | සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර හා ප්‍රවාහණ උපකරණ නිෂ්පාදනය .. | 210 | 184,426 | 60,829 | 33·0 |
| XI. | නිෂ්පාදිත භාණ්ඩ (අ. ස. නො.) .. | 16 | 44,265 | 3,049 | 6·9 |
| | එකතුව .. | 955 | 1,304,318 | 524,797 | 40·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**4· අගය එකතුව**

1974 කාර්මික අංශයේ අගය එකතුව වර්තන මිළ අනුව II (ඇ) 3 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. වාර්තා කළ එක් එක් ව්‍යවසායයේ මුළු නිෂ්පාදන අගයන් අමු ද්‍රව්‍ය වල හා ඉන්ධන පිරිවැය අඩු කිරීමෙන් අගය එකතුව ගණනය කරනු ලැබීය. වර්තන මිළ අනුව මුළු අගය එකතුව සියයට 33·4 කින් වැඩි වී ඇත. එහෙත් මූර්ත වශයෙන් 1974 දී අගය එකතුව සියයට 9·1 කින් අඩු වී ඇත.

## II (ඇ) 3 සංඛ්‍යා සටහන

### ප්‍රධාන කාර්මික ගණ අනුව කර්මාන්තයේ අගය එකතුව 1970-1974

රුපියල් දශලක්ෂ

| කාර්මික ගණය | 1970 | 1971 | 1972 | 1973 | 1974 |
|---|---|---|---|---|---|
| I. ආහාරපාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් .. | 520·2 | 564·7 | 606·9 | 680·9 | 690·1 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | 155·5 | 168·4 | 217·0 | 192·9 | 257·1 |
| III. දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) . | 12·3 | 15·4 | 17·8 | 17·9 | 32·3 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 22·8 | 24 6 | 27·7 | 39·2 | 47·1 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 241·6 | 309·9 | 310·0 | 191·4 | 635·3 |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 77·7 | 98·8 | 96·9 | 125·9 | 51·9 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. | 7·8 | 11·7 | 13·6 | 8·2 | 20·9 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරන නිෂ්පාදනය . | 92·2 | 98·5 | 109·8 | 140·1 | 135·8 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 4 8 | 6·0 | 7·9 | 13·5 | 10·4 |
| එකතුව .. .. | 1,134·9 | 1,298·0 | 1,407·6 | 1,410·0 | 1,880·9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 5. කර්මාන්ත ව්‍යුහය

1971 - 74 කාලය තුළ කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව II (ඇ) 4 සංඛ්‍යා සටහනේ දක්වේ.

ගත වූ දශකයක කාලයක් තුළ පමණ ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යුහයෙහි පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය ප්‍රධාන තැනක් ගෙන තිබුණේ විය. එහෙත් 1974 දී අන්තර් භාණ්ඩ නිෂ්පාදන ගණයේ වටිනාකම පාරිභෝගික භාණ්ඩ නිමැවුමේ වටිනාකම ඉක්මවා ඇත. මෙය ඇතැම් විට මේ වර්ෂය තුළ ඛනිජ නිෂ්පාදනවල වටිනාකමේ ඇති වූ අධික වැඩිවීම නිසා විය හැකි ය. ප්‍රධාන වශයෙන් දැඩි සේ ආනයන භාණ්ඩ මත රඳා පැවතීම හා වෙළෙඳ පොළේ සීමිත බව නිසා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය ඉතා පහළ මට්ටමක පැවතුනි.

නිපැයුමේ වටිනාකම අනුව ආයතනයන්ගේ ව්‍යාප්තිය පෙන්වන II (ඇ) 5 සංඛ්‍යා සටහනින් හෙළි වනුයේ කර්මාන්ත තවදුරටත් රාශිභූත වූ බවකි. ගත වූ වර්ෂයේ නිපැයුමෙන් සියයට 86.ක් ආයතන 202 ක් මගින් නිපද වූ අතර, 1974 දී නිපැයුමෙන් සියයට 89 ක් පමණ ආයතන 140 ක් විසින් නිපදවනු ලැබ ඇත. එහෙත් රුපියල් 2,50,000 කට අඩු නිපැයුමක් ඇති ආයතන සංඛ්‍යාව සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. 1973 දී මෙම කාණ්ඩය තුළ ආයතන 817 ක් විසින් මුළු නිපැයුමෙන් සියයට 2·2 ක් නිපද වූ අතර, 1974 දී එකී ප්‍රමාණය නිපදවන ආයතන සංඛ්‍යාව 1044 තෙක් වැඩි විය.

## 6. සේවා නියුක්තිය සහ වැටුප්

කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය හා වැටුප් පිළිබඳ දත්තයන් II (ඇ) 1 සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

## II. (ඇ) 4 සංඛ්‍යා සටහන

### 1970—74 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම ප්‍රධාන ආර්ථික ගණ අනුව

| කාර්මික ගණය | රුපියල් දශ ලක්ෂ 1970 | 1971 | 1972 | 1973 | 1974 | සියයට ගණන 1970 | 1971 | 1972 | 1973 | 1974 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **අ. පාරිභෝගික භාණ්ඩ** | **917.0** | **1101.2** | **1265.0** | **1275.9** | **1712.0** | **47.2** | **49.9** | **51.8** | **46.2** | **41.8** |
| I. ආහාරපාන හා දුම්කොළ | 346.7 | 428.4 | 520.9 | 561.9 | 759.1 | 17.8 | 19.4 | 21.3 | 20.4 | 18.6 |
| අ. සැකසූ ආහාර 1 | 82.9 | 139.0 | 189.0 | 182.2 | 342.0 | 4.3 | 6.3 | 7.7 | 6.6 | 8.4 |
| ආ. කල්තැබිය හැකි සහ ටින්වල අසුරන ලද පලතුරු, එළවළු, මස්, මාළු සහ අනෙකුත් මුහුදු ආහාර (2) | 11.8 | 23.2 | 11.5 | 12.5 | 48.0 | 0.6 | 1.1 | 0.4 | 0.5 | 1.2 |
| ඇ. බිස්කෝතු සහ රසකැවිලි | 50.5 | 53.1 | 50.2 | 44.3 | 47.2 | 2.5 | 2.4 | 2.1 | 1.6 | 1.2 |
| ඈ. සිසිල් බීම | 26.6 | 26.1 | 21.1 | 22.4 | 5.3 | 1.4 | 1.2 | 10.9 | 0.8 | 0.1 |
| ඉ. අරක්කු, බීර යනාදිය | 68.3 | 62.1 | 75.4 | 72.4 | 111.5 | 3.5 | 2.8 | 3.1 | 2.6 | 2.7 |
| ඊ. දුම්කොළ | 106.6 | 124.9 | 173.7 | 228.1 | 205.1 | 5.5 | 5.6 | 7.1 | 8.3 | 5.0 |
| II. ඇඳුම් පැළඳුම් (3) | 64.3 | 70.8 | 66.7 | 64.1 | 100.0 | 3.3 | 3.2 | 2.7 | 2.3 | 2.4 |
| III. පාවහන් සහ සම් භාණ්ඩ | 45.1 | 46.0 | 56.6 | 60.1 | 71.4 | 2.3 | 2.1 | 2.3 | 2.2 | 1.7 |
| IV. විවිධ රසායනික භාණ්ඩ (4) | 155.9 | 230.3 | 213.5 | 161.4 | 242.9 | 8.0 | 10.4 | 8.7 | 5.9 | 5.9 |
| V. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (5) | 13.1 | 18.0 | 40.4 | 74.5 | 9.9 | 0.7 | 0.8 | 1.7 | 2.7 | 0.2 |
| VI සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රෝපකරණ හැර (6) | 3.4 | 3.6 | 5.0 | 5.3 | 12.1 | 0.2 | 0.2 | 0.2 | 0.2 | 0.3 |
| VII. ප්ලාස්ටික් භාණ්ඩ | 32.8 | 37.7 | 17.9 | 20.1 | 20.0 | 1.7 | 1.7 | 0.7 | 0.6 | 0.5 |
| VIII. වීදුරු සහ වීදුරු භාණ්ඩ | 8.1 | 13.9 | 11.9 | 12.8 | 12.7 | 0.4 | 0.6 | 0.5 | 0.4 | 0.3 |
| IX. පිඟන් බඩු | 8.0 | 8.5 | 12.9 | 13.1 | 44.6 | 0.4 | 0.4 | 0.5 | 0.5 | 1.1 |
| X. රබර් භාණ්ඩ | 56.4 | 60.2 | 67.7 | 67.8 | 129.0 | 2.9 | 2.7 | 2.8 | 2.5 | 3.2 |
| XI. වියන ලද හා නිමකරන ලද රෙදිපිළි | 154.2 | 147.9 | 208.4 | 190.0 | 290.5 | 8.0 | 6.7 | 8.5 | 6.9 | 7.1 |
| XII. දුව නිෂ්පාදන | 10.4 | 12.8 | 12.7 | 11.6 | 32.6 | 0.5 | 0.6 | 0.5 | 0.4 | 0.1 |
| XIII. නිෂ්පාදිත භාණ්ඩ අන් තැනක සඳහන් නොවූ (7) | 18.6 | 23.1 | 30.4 | 33.2 | 16.2 | 1.0 | 1.1 | 1.3 | 1.2 | 0.4 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **800.3** | **842.8** | **866.6** | **1,167.7** | **1980.4** | **41.1** | **38.2** | **35.5** | **42.5** | **48.4** |
| I. ආහාර නිෂ්පාදිතයන් (8) | 337.8 | 314.6 | 277.8 | 357.7 | 488.2 | 17.4 | 14.3 | 11.4 | 13.0 | 11.9 |
| II. සැදූ ලෝහ භාණ්ඩ යන්ත්‍රසූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ හැර (9) | 93.5 | 124.4 | 106.1 | 130.3 | 107.3 | 4.8 | 5.6 | 4.3 | 4.7 | 2.6 |
| III. කඩදාසි නිෂ්පාදිතයන් සහ කඩදාසි භාණ්ඩ (10) | 51.9 | 52.3 | 38.7 | 26.5 | 126.6 | 2.7 | 2.4 | 1.6 | 1.0 | 3.1 |
| IV. නූල් කැටීම (රෙදිපිළි) | 19.1 | 41.5 | 62.8 | 106.6 | 108.8 | 0.9 | 1.9 | 2.6 | 3.9 | 2.7 |
| V. කූනී ලෑලි | 10.8 | 13.8 | 18.0 | 31.4 | 49.5 | 0.6 | 0.6 | 0.7 | 1.1 | 1.2 |
| VI. ඉල්මනයිට් නිෂ්පාදිතයන් | 4.7 | 6.2 | 3.7 | 4.8 | 2.4 | 0.2 | 0.3 | 0.2 | 0.2 | 0.1 |
| VII. කාර්මික රසායන (11) | 3.1 | 3.3 | 5.2 | 5.6 | 6.2 | 0.2 | 0.1 | 0.2 | 0.2 | 0.2 |
| VIII. විදුලි යන්ත්‍ර සූත්‍ර, මෙවලම්, උපකරණ සහ සැපයුම් | 88.4 | 88.2 | 94.8 | 109.0 | 136.5 | 4.5 | 4.0 | 3.9 | 4.0 | 3.3 |
| IX. පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිතයන් | 191.0 | 198.5 | 259.5 | 395.8 | 954.9 | 9.8 | 9.0 | 10.6 | 14.4 | 23.3 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **227.7** | **263.7** | **310.8** | **315.0** | **401.5** | **11.7** | **11.9** | **12.7** | **11.4** | **9.8** |
| I. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිතයන් සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිතයන් | 104.8 | 116.7 | 110.4 | 131.4 | 160.8 | 5.4 | 5.3 | 4.5 | 4.8 | 3.9 |
| II. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර හැර) සහ ප්‍රවාහණ උපකරණ | 70.8 | 57.3 | 98.9 | 102.5 | 93.4 | 3.6 | 2.6 | 4.0 | 3.7 | 2.3 |
| III. ගඩොල් සහ උළු | 13.2 | 31.1 | 34.0 | 27.9 | 17.7 | 0.7 | 1.4 | 1.4 | 1.0 | 0.4 |
| IV. යකඩ සහ වානේමූලික කර්මාන්ත (12) | 38.9 | 58.6 | 67.5 | 53.2 | 129.6 | 2.0 | 2.6 | 2.8 | 1.9 | 3.2 |
| **එකතුව** | **1,945.0** | **2,207.7** | **2,442.4** | **2,758.6** | **4,093.9** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

මූලය; ශ්‍රී ලංකා මහ බැංකුව.

1. කිරි නිෂ්පාදන, අයිස් ක්‍රීම් සහ ලුණු යනාදිය
2. ජෑම් වර්ග, ජෙලි වර්ග, සෝස් වර්ග, පලතුරු කෝඩියල් යනාදිය
3. කමිස බැනියම් යනාදිය
4. භෛෂජ්‍ය ද්‍රව්‍ය, අංගරාජ සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනි පෙට්ටි, දන්තාලේප යනාදිය
5. ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය
6. ඇලුමිනියම් භාණ්ඩ
7. බුරුසු, ගල්ලෑලි, මුද්‍රණ, බ්ලොක්, සෙල්ලම් බඩු හා සංගීත භාණ්ඩ යනාදිය
8. ගව සහ කුකුල් ආහාර එළවළු තෙල් වර්ග, අයිස්, කපාපු පොල් යනාදිය
9. භාජන, කටු කම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් භාණ්ඩ
10. මුද්‍රණ කඩදාසි, කාටන්, අනිකුත් ඇසුරුම් පෙට්ටි සහ ඔතන කඩදාසි
11. කෝස්ටික් සෝඩා සහ ක්ලෝරීන්
12. රෝල් සහ කම්බි භාණ්ඩ

## II (ඇ) 5 සංඛ්‍යා සටහන

## 1974 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදීගිය අයුරු-නිමැවුම් වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිමැවුම් වටිනාකම: රුපියල් 250,000 ට අඩු | රු. 250,000 සිට රු. දශලක්ෂ 2 දක්වා | රු. දශලක්ෂ 2 ට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 93 | 39 | 22 | 154 |
| | නිමැවුමේ % ගණන | 0·7 | 3·5 | 95·8 | 100·0 |
| II. රෙදි පිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 518 | 80 | 36 | 634 |
| | නිමැවුමේ % ගණන | 4·3 | 9·6 | 86·0 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 14 | 3 | 1 | 18 |
| | නිමැවුමේ % ගණන | 2·2 | 4·7 | 93·1 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 35 | 23 | 6 | 64 |
| | නිමැවුමේ % ගණන | 2·3 | 11·7 | 86·0 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් | සමාගම් ගණන | 134 | 46 | 26 | 206 |
| | නිමැවුමේ % ගණන | 2·5 | 9·6 | 87·9 | 100·0 |
| VI. ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 47 | 12 | 8 | 67 |
| | නිමැවුමේ % ගණන | 3·2 | 6·9 | 89·9 | 100·0 |
| VII මූලික ලෝහ නිෂ්පාදනයන් | සමාගම් ගණන | — | — | 1 | 1 |
| | නිමැවුමේ % ගණන | — | — | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 189 | 89 | 39 | 317 |
| | නිමැවුමේ % ගණන | 3·8 | 19·0 | 77·2 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) | සමාගම් ගණන | 14 | 13 | 1 | 28 |
| | නිමැවුමේ % ගණන | 4·8 | 67·4 | 27·8 | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 1,044 | 305 | 140 | 1,489 |
| | නිමැවුමේ % ගණන | 2·3 | 8·5 | 89·2 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ගත වූ වර්ෂයට වඩා 1974 දී වාර්තා කරන ලද ආයතන සංඛ්‍යාවේ වැඩිවීමක් තිබියදීත් මුළු සේවක සංඛ්‍යාව සැලකිය යුතු වශයෙන් පහත වැටීමත්, එක් සේවකයකුට වැටෙන සාමාන්‍ය ශ්‍රම දින ගණන අඩුවීමත්, කාර්මික අංශයේ වූ වැදගත් ලක්ෂණයකි. 1974 දී කර්මාන්ත අංශයේ ආයතන 1497 ක් වාර්තා කළ අන්දමට මුළු සේවක පිරිස 96,668 කි. මෙය ගත වූ වර්ෂයේ ආයතන 1419 ක් විසින් වාර්තා කළ ප්‍රමාණයට වඩා සියයට 8·6 ක අඩුවීමකි. සේවා නියුක්තියේ අඩුවීම ආහාර පාන සහ දුම්කොළ නිෂ්පාදන අංශයේ ඉතාමත් ප්‍රකට වේ. 1974 දී සේවක සංඛ්‍යාව අඩු වුවද, මුළු වැටුප් බිල රුපියල් ලක්ෂ 3797 ක් විය; මෙය ගත වූ වර්ෂයට වඩා සියයට 1ᴺ ක වැඩිවීමකි. එක් ශ්‍රම දිනක වැටුප ද 1973 දී රුපියල් 12 89 සිට 1974 දී රුපියල් 19 17 තෙක් වැඩි විය. වැටුප් වැඩිවීමට ප්‍රධාන වශයෙන් 1974 දී වැටුප් අනුපාතිකයේ ඇති වූ සැලකිය යුතු වැඩිවීම හේතු විය. කර්මාන්ත හා වාණිජ අංශවල අවම කම්කරු වැටුප් දර්ශකය 1974 දී ගත වූ වර්ෂයට වඩා සියයට 18 කින් වැඩි විය.

වැටුප් බිල අනුව නිෂ්පාදන කර්මාන්තයන්හි විශාලත්වය බෙදී ගිය අයුරු II (ඇ) 6 සංඛ්‍යා සටහනින් දක්වේ. ඒ අනුව වැටුප් බිලෙන් සියයට 8๒·6 ක් මුළු ආයතන සංඛ්‍යා-වෙන් සියයට 6·5 ක් පමණ අල්ප වූ ආයතන කිපයත් විසින් ගෙවා ඇති බව පෙන්නුම් කෙරේ. මින් සේවා නියුක්තිය විශාල ආයතන තුළ, විශේෂයෙන් රාජ්‍ය සංස්ථාවල රාශිභූත වී ඇති අන්දම පිළිබිඹු කෙරේ.

## II (ඇ) 6 සංඛ්‍යා සටහන

### 1974 නිෂ්පාදන සමාගම්, විශාලත්වය අනුව බෙදී ගිය අයුරු-වැටුප් පිරිවැය පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. 15 දහසට අඩු | රුපි. 15 දහස — 50 දහස දක්වා | රුපි. 50 දහස — 500,000 දක්වා | රුපි. 500,000 සහ වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 62 | 54 | 31 | 15 | 162 |
| | වැටුප් බිලේ % ගණන | 0·4 | 1·8 | 5·2 | 92·6 | 100·0 |
| II. රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත | සමාගම් ගණන | 438 | 107 | 92 | 22 | 659 |
| | වැටුප් බිලේ % ගණන | 2·7 | 3·8 | 19·0 | 74·4 | 100·0 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) | සමාගම් ගණන | 6 | 7 | 6 | 2 | 21 |
| | වැටුප් බිලේ % ගණන | 0·3 | 1·1 | 4·0 | 94·7 | 100·0 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 23 | 20 | 17 | 6 | 66 |
| | වැටුප් බිලේ % ගණන | 0·8 | 3·2 | 12·5 | 83·5 | 100·0 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය | සමාගම් ගණන | 96 | 42 | 52 | 17 | 207 |
| | වැටුප් බිලේ % ගණන | 0·8 | 1·7 | 11·8 | 85·7 | 100·[illegible] |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) | සමාගම් ගණන | 27 | 19 | 17 | 6 | 69 |
| | වැටුප් බිලේ % ගණන | 0·6 | 2·1 | 7·6 | 89·7 | 100·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් | සමාගම් ගණන | – | – | – | 1 | 1 |
| | වැටුප් බිලේ % ගණන | – | – | – | 100·0 | 100·0 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනයන් | සමාගම් ගණන | 119 | 71 | 99 | 31 | 320 |
| | වැටුප් බිලේ % ගණන | 1·6 | 3·6 | 28·0 | 66·8 | 100·0 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවූ) | සමාගම් ගණන | 9 | 4 | 14 | – | 27 |
| | වැටුප් බිලේ % ගණන | 3·1 | 5·4 | 91·5 | – | 100·0 |
| එකතුව | සමාගම් ගණන | 780 | 324 | 328 | 100 | 1,532 |
| | වැටුප් බිලේ % ගණන | 1·2 | 2·5 | 13·7 | 82·6 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 7. අමු ද්‍රව්‍ය භාවිතය

1974 දී අමු ද්‍රව්‍ය භාවිතය II (ඇ) 7 හා II (ඇ) 8 වැනි සංඛ්‍යා සටහන් මගින් පෙන්නුම් කෙරේ. මින් පළමු සංඛ්‍යා සටහනින් ප්‍රධාන කාර්මික ගණ අනුව දේශීය හා ආනයනය කරනු ලැබූ අමු ද්‍රව්‍ය භාවිතය දක්වෙන අතර, දෙවැන්න භාවිත අමු ද්‍රව්‍ය ප්‍රභවය අනුව වර්ග කෙරේ. 1974 දී කර්මාන්ත අංශය භාවිතා කළ අමු ද්‍රව්‍ය ප්‍රමාණය මුළු නිපැයුමේ වටිනාකමෙන් සියයට 62·7 ක් වූ අතර, 1973 දී මෙය සියයට 54·0 ක් විය. මෙ සැලකිය යුතු වර්ධනය තෙල් අර්බුදය හේතු කොට ගෙන මිළ මට්ටමේ වූ වැඩිවීම පිළිබිඹු කරයි.

### II (ඇ) 7 සංඛ්‍යා සටහන

### දේශීය සහ විදේශීය අමු ද්‍රව්‍ය භාවිතය - 1974

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | නිෂ්පාදනය රුපියල් දශලක්ෂ | අමු ද්‍රව්‍ය | | | |
|---|---|---|---|---|---|---|
| | | | මුළු වටිනාකම (රුපියල් දහස් ගණනින්) | දේශීය | විදේශීය | |
| | | | | වටිනාකම (රුපියල් දහස් ගණනින්) | වටිනාකම (රුපියල් දහස් ගණනින්) | සියයට් ගණන |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් .. | 137 | 851·1 | 608,074 | 308,467 | 299,607 | 49·3 |
| II. රෙදිපිළි, ඇඳුම් පැලඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 596 | 563·6 | 295,870 | 95,059 | 200,810 | 67·9 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 16 | 52·8 | 18,298 | 15,903 | 2,395 | 13·1 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | 62 | 136·1 | 66,095 | 29,725 | 36,370 | 55·0 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය . | 2[illegible]5 | 1,323·3 | 1,040,796 | 115,379 | 925,417 | 88·9 |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 66 | 228·1 | 52,841 | 41,784 | 10,457 | 19·8 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් | 1 | 129·6 | 57,391 | — | 57,391 | 100·0 |
| VIII. සකස් කළ ලෝහභාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. | 304 | 341·0 | 139,532 | 39,341 | 100,191 | 71·8 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන්තැනක සඳහන් නොවූ) | 28 | 16·0 | 5,195 | 1,273 | 3,922 | 75·1 |
| එකතුව .. | 1,475 | 3,641·6 | 2,284,092 | 646,931 | 1,,636,560 | 71·6 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## II (ඇ) 8 වැනි සංඛ්‍යා සටහන

## අමුද්‍රව්‍ය වල වටිනාකම - 1974

(රුපියල්)

| කාර්මික ගණය | කෘෂිකාර්මික | ඛණිජ | කාර්මික | එකතුව |
|---|---|---|---|---|
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය .. | 462,060,403 | 2,224,023 | 143,789,894 | 608,074,320 |
| II. රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | 155,371,791 | 10,632,102 | 129,865,492 | 295,869,385 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 13,502,734 | 31,092 | 4,764,072 | 18,297,898 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනය .. | 1,792,703 | 1,121,466 | 63,181,260 | 66,095,429 |
| V. රසායන ද්‍රව්‍ය පෙට්‍රෝලියම් ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනය .. | 46,381,780 | 879,282,322 | 115,131,838 | 1,040,795,940 |
| VI. ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනයන් (පෙට්‍රෝලියම් ගල් අඟුරු හැර) .. | 414,902 | 39,705,611 | 9,020,696 | 49,141,209 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනය .. | — | 57,391,024 | — | 57,391,024 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය .. | 4,602,091 | 40,291,538 | 94,638,711 | 139,532,340 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අ. ස. නො.) | 963,250 | 734,167 | 3,497,568 | 5,194,985 |
| එකතුව | 685,089,654 | 1,031,413,345 | 563,889,531 | 2,280,392,530 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1974 වර්ෂය තුළදී ආනයනය කරනු ලැබූ අමු ද්‍රව්‍ය පිරිවැය එම වර්ෂයේ භාවිතා වූ මුළු අමු ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 71·6 ක් වූ අතර, ඊට පෙර වර්ෂයේදී මෙම ගණන සියයට 66·7 ක් විය. ආනයන අමු ද්‍රව්‍යවල වියදමෙහි වූ මෙකී වැඩිවීම 1974 දී දේශීය කර්මාන්ත අංශය ආනයනය කරනු ලැබූ අමු ද්‍රව්‍ය සාපේක්ෂකව වැඩි ප්‍රමාණයක් භාවිතා කළ බවක් අත්‍යවශ්‍යයෙන් නොපෙන්වයි. මූලිකවම මෙකී වැඩිවීමට ආනයන මිළ මට්ටම ඉහළ යෑම හේතු වේ. එසේ වුවද, පෙරාතු වර්ෂයන් හා සසඳන කළ කඩදාසි භාණ්ඩ නිෂ්පාදිත, ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) සහ සකස් කල ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ නිෂ්පාදන අංශවල ආනයනවල වටිනාකම සැළකිය යුතු අන්දමින් පහත වැටී ඇත.

කර්මාන්ත අංශයේ භාවිතා කළ අමු ද්‍රව්‍යවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් ඛණිජ ප්‍රභවයෙනි. මුළු මහත් කර්මාන්ත අංශය විසින් භාවිතා කරනු ලැබූ සියළු අමු ද්‍රව්‍යවලින් සියයට 37·5 ක් පමණ වූ ඛණිජ තෙල් ආනයනවල අධික වටිනාකම මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු විය. කෘෂි ප්‍රභවයකින් යුක්ත වූ අමු ද්‍රව්‍ය ප්‍රමාණය සියයට 30·0 ක් වූ අතර, කාර්මික ප්‍රභවයකින් යුත් අමු ද්‍රව්‍ය ප්‍රමාණය භාවිත සියළු අමු ද්‍රව්‍ය ප්‍රමාණයෙන් සියයට 24·8 ක් විය. සාපේක්ෂකව අඩු ප්‍රමාණයක් කාර්මික අන්තර් භාණ්ඩ භාවිතය ඌන සංවර්ධිත ආර්ථිකයක ලක්ෂණයකි.

## 8. බල හා ඉන්ධන භාවිතය

බල හා ඉන්ධන පිරිවැයෙහි වූ ගැඹුරු නැගීම 1974 වර්ෂයේ අතිශයින්ම කැපී පෙනෙන ලක්ෂණය විය. භාවිතා කරනු ලැබූ බල හා ඉන්ධනවල වටිනාකම II (ඇ) 9 වැනි සංඛ්‍යා සටහනෙන් දක්වේ. 1973 හා සසඳන කල භාවිතා වූ බල හා ඉන්ධනවල වටිනාකම සියයට 210 කින් ඉහළ නැග ඇත. මින් අතිශයින්ම ප්‍රකටව පෙනුනේ සියයට 244 ක් වූ පෙට්‍රල් අගයේ වැඩිවීමය. ගල් අඟුරු සහ ගෑස් වටිනාකමෙහි වූ වැඩිවීම සැලකිය යුතු වන අතර, විදුලි බලය වටිනාකමෙහි වූ වැඩිවීම මධ්‍යස්ථ විය.

### II (ඇ) 9 සංඛ්‍යා සටහන
### නිෂ්පාදනය බල සහ ඉන්ධන - 1974

| කාර්මික ගණය | සමාගම් ගණන | නිෂ්පාදනය (රුපියල් දශලක්ෂ) | පාවිච්චි කළ ඉන්ධන (රුපියල් දහස් ගණනින්) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු සහ ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් .. | 128 | 694·2 | 2,273 | 203 | 9,642 | 269 | 12,387 |
| II. රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම්භාණ්ඩ කර්මාන්ත .. | 612 | 561·9 | 4,421 | 47 | 11,412 | 150 | 16,030 |
| III. දැව සහ දැව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 17 | 52·9 | 649 | 1,236 | 206 | 137 | 2,228 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 62 | 135·7 | 2,686 | 3 | 7,186 | 11 | 9,886 |
| V. රසායන ද්‍රව්‍ය, පෙට්‍රෝලියම්, ගල් අඟුරු රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 199 | 373·9 | 4,114 | 28 | 12,626 | 298 | 17,066 |
| VI. ලෝහ නොවන ඛනිජ භාණ්ඩ නිෂ්පාදිතයන් (පෙට්‍රෝලියම් සහ ගල් අඟුරු හැර) .. | 63 | 138·1 | 5,591 | 42 | 11,307 | 26,985 | 43,926 |
| VII. මූලික ලෝහ නිෂ්පාදනයන් .. | 1 | 129·6 | 2,010 | — | 5,035 | — | 7,045 |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ නිෂ්පාදනය . | 309 | 337·6 | 3,026 | 3,560 | 4,019 | 1,993 | 12,598 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අන් තැනක සඳහන් නොවූ) .. | 28 | 16·0 | 122 | 141 | 85 | 8 | 355 |
| එකතුව .. | 1,419 | 2,439·9 | 24,892 | 5,260 | 61,518 | 29,851 | 121,521 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1974 දී බලය හා ඉන්ධන වටිනාකමෙහි වූ ගැඹුරු නැගීම නව වර්ෂයේ ඛණිජ නිෂ්පාදන මිළ ඉහළ යෑමේ සෘජු ප්‍රතිඵලයකි. එනිසා වටිනාකමෙහි වූ මෙකී වැඩිවීම 1974 කාර්මික අංශයේ පාරිභෝජනය කරනු ලැබූ බල හා ඉන්ධන ප්‍රමාණයේ වැඩිවීමක් පෙන්නුම් නොකරන බවට ඉඳුරාම ඉඩකඩ ඇත.

## 9. කර්මාන්ත පිහිටීම

ශ්‍රී ලංකාවේ කර්මාන්තයන්ගේ භූගෝලීය ව්‍යාප්තිය II (ඇ) 10 වැනි සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. ගත වූ දශකයක පමණ කාලයක් තුළ කර්මාන්තයන්ගේ භූගෝලීය ව්‍යාප්තිය වෙනස් වී ඇත්තේ ඉතාමත් මද වශයෙනි. කර්මාන්තයන් තදින්ම රාශිභූත වී ඇත්තේ මුළු කර්මාන්ත ආයතනයන්ගෙන් සියයට 74·0 ක් පිහිටා ඇති කොළඹ දිස්ත්‍රික්කයෙහිය. රාශිභූතවීම සියයට 80·0 ක් පමණ වූ ගිය වර්ෂයට වඩා මෙය තරමක් අඩුය. රෙදිපිළි කර්මාන්තයන්ගේ පුළුල් ව්‍යාප්තියක් 1974 දී සිදුවී ඇත. කර්මාන්ත පිහිටීම වැඩි වශයෙන්ම රඳා පවත්නේ අමු ද්‍රව්‍ය ලබාගැනීමේ හැකියාව, බලය, ප්‍රවාහන හා වෙළෙඳ පහසුකම් තිබීම යන කාරණා මතය. තෙල් මිළ සීඝ්‍රයෙන් වැඩිවීම නිසා ප්‍රවාහන වියදම කර්මාන්තයන්ගේ වැඩිදුර ව්‍යාප්තියට බාධකයක් වනු ඇත. ප්‍රවාහන උපකරණ හා අමතර කොටස් හිඟය ද වැඩිමනත් බාධකයක් සේ ක්‍රියා කරනු ඇත.

## පළාත් අනුව කර්මාන්තයන්ගේ

| කාර්මික ගණය | බස්නාහිර පළාත | | | උතුරු පළාත | | | නැගෙනහිර පළාත | | | දකුණු පළාත | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | |
| | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය |
| I. ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනයන් .. | 93 | 864,504 | 25·9 | 12 | 44,311 | 20·8 | 3 | 200 | 0·2 | 9 | 4,341 | 6·0 |
| II. රෙදිපිළි ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ කර්මාන්ත .. | 452 | 543,817 | 16·3 | 20 | 5,447 | 2·6 | 9 | 1,039 | 1·2 | 45 | 11,232 | 15·6 |
| III. දව සහ දව භාණ්ඩ (ගෘහ භාණ්ඩ ඇතුළුව) .. | 14 | 3,171 | 0·1 | — | — | — | — | — | — | 3 | 49,933 | 69·4 |
| IV. කඩදාසි සහ කඩදාසි භාණ්ඩ නිෂ්පාදනයන් .. | 58 | 49,831 | 1·5 | 2 | 387 | 0·2 | 1 | 85,498 | 95·7 | 3 | 811 | 1·1 |
| V. රසායනික ද්‍රව්‍ය, පෙට්‍රෝලියම් ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදනයන් .. | 164 | 1,309,492 | 39·3 | 9 | 10,500 | 4·9 | — | — | — | 11 | 920 | 1·3 |
| VI. ලෝහ නොවන ඛණිජ භාණ්ඩ නිෂ්පාදනයන් (ඛණිජ තෙල් සහ ගල් අඟුරු හැර) .. | 47 | 93,360 | 2·8 | 4 | 140,133 | 65·8 | 2 | 2,448 | 2·7 | 7 | 1,427 | 2·0 |
| VII. මූලික ලෝහ නිෂ්පාදන .. | 1 | 129,564 | 3·9 | — | — | — | — | — | — | — | — | — |
| VIII. සකස් කළ ලෝහ භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර සහ ප්‍රවාහණ උපකරණ නිෂ්පාදනය .. | 251 | 324,125 | 9·7 | 12 | 11,664 | 5·5 | 2 | 163 | 0·2 | 16 | 3,245 | 4·5 |
| IX. නිෂ්පාදිත භාණ්ඩ (අ·ස·නො·) .. | 23 | 15,435 | 0·5 | 1 | 442 | 0·2 | — | — | — | 1 | 1 | — |
| එකතුව .. | 1,103 | 3,333,299 | 89·2 | 60 | 212,884 | 5.7 | 17 | 89,348 | 2·4 | 95 | 71,910 | 1·9 |

II (ඇ) 10 වැනි සංඛ්‍යා සටහන

පිහිටීම - 1974

| මධ්‍යම පළාත | | | වයඹ පළාත | | | සබරගමු පළාත | | | උතුරු මැද පළාත | | | ඌව පළාත | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | | නිෂ්පාදනය | |
| ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය | ආයතන සංඛ්‍යාව | වටිනාකම රු. දහස් ගණනින් | ප්‍රතිශතය |
| 17 | 6,094 | 39·4 | 11 | 1,237 | 14·3 | 9 | 520 | 28·6 | — | — | — | — | — | — | 154 | 921,208 | 24·7 |
| 71 | 6,137 | 39·7 | 15 | 1,570 | 18·2 | 14 | 864 | 47·5 | 3 | 187 | 10·6 | 5 | 765 | 73·5 | 634 | 571,057 | 15·3 |
| 1 | 16 | 0·1 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 18 | 53,123 | 1·4 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 64 | 136,526 | 3·6 |
| 13 | 1,055 | 6·8 | 3 | 1,074 | 12·4 | 2 | 156 | 8·6 | 4 | 58 | 3·3 | 1 | 193 | 18·5 | 207 | 1,323,448 | 35·4 |
| 3 | 211 | 1·4 | 4 | 628 | 7·3 | — | — | — | 1 | 2 | 0·1 | — | — | — | 68 | 238,209 | 6·4 |
| — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | — | 1 | 129,564 | 3·5 |
| 8 | 1,820 | 11·8 | 16 | 4,122 | 47·8 | 4 | 279 | 15·3 | 5 | 1,517 | 86·0 | 3 | 83 | 8·0 | 317 | 347,019 | 9·3 |
| 3 | 118 | 0·8 | — | — | — | — | — | — | — | — | — | — | — | — | 28 | 15,996 | 0·4 |
| 16 | 15,451 | 0·4 | 49 | 8,631 | 0·2 | 29 | 1,819 | 0·1 | 13 | 1,764 | 0·1 | 9 | 1,041 | 0·0 | 1,491 | 3,736,150 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව